**කැකිරාව ප්‍රාදේශීය සභාව - 2021**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කැකිරාව ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය/ ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කැකිරාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අංක 3.7 ප්‍රකාරව අස්ථිත්වයක් පිළියෙල කළ අයවැය ලේඛනවල අයවැයගත තොරතුරු එම කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළයුතු වුවත් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන අයවැයගත තොරතුරු රහිතව ඉදිරිපත් කර තිබුණි. | පිළිගනිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 3.7 ප්‍රකාරව ක්‍රියාකළ යුතුවේ. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය අනුව අතිරික්තයේ හෝ (ඌනතාවයේ) ඇතුළත් කර නොමැති ප්‍රාග්ධන වියදම් දීමනා 2021 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.140,620,280 ක් විය යුතු වුවත් එය රු.207,724,902 ක් ලෙස දක්වා තිබුණි. | පිළිගනිමි. | ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ ශේෂය නිවැරදිව දැක්විය යුතුවේ. |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 04 ක උපලේඛන අනුව වටිනාකම සහ වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ සඳහන් වටිනාකම් අතර රු.55,106,734 ක වෙනසක් විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | වෙනසට හේතුව සොයා බලා ශේෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන 05 ක ඉන්ධන දහන පරීක්ෂා සිදුකර නොතිබුණි. | පිළිගනිමි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ක්‍රියාකළ යුතුවේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | උතුරු මැද පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2020 අගෝස්තු 28 දිනැති අංක NCP/LG/DE/04/04/2020 දරන ලිපිය | සභාවේ යන්ත්‍ර උපකරණ ණය පදනම මත කුලියට ලබාදීම නොකරන ලෙස උපදෙස් ලබාදී තිබියදී සභාවේ යන්ත්‍ර ණය පදනම මත ලබාදීම නිසා රු.3,488,150 ක හිඟ මුදලක් අයකර ගැනීමට තිබුණු අතර යන්ත්‍ර කුලියට දීමට අදාළ විස්තරාත්මක උපලේඛන සහ ණයගැති කාල විශ්ලේෂණ පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේදී මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. | සියලු හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට ක්‍රියාකළ යුතුවේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අයහාරය ඉක්මවූ වියදම රු.25,931,467 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අයහාරය ඉක්ම වූ වියදම රු.9,591,249 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.4,248,043 ක් වූ හිඟ වරිපනම් අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. | පනතට අනුව සියලු හිඟ මුදල් අයකර ගැනීමට ක්‍රියාකළ යුතුවේ. |
| (ආ) | **කුලී** | | |
| | වත්කම් බදුදීම වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.2,126,301 ක් හා කඩකුලී රු.1,132,400 ක් අයකරගෙන නොතිබුණි. | අදාළ නීතිමය කටයුතුවලින් ලැබෙන තීරණ අනුව හිඟ මුදල් අයකිරීමට කටයුතු කරමි. | අදාළ හිඟ මුදල් අයකිරීමට ක්‍රියාකළ යුතුවේ. |
| (ඇ) | **බලපත්‍ර ගාස්තු** | | |
| (i) | 2021 වර්ෂයේ හා පෙර වර්ෂයේ පරිසර බලපත්‍ර ලබානොගැනීම නිසා රු.272,000 ක ආදායමක් අයවී නොතිබුණි. | තවදුරටත් හිඟහිටි ප්‍රමාණය අයකර ගැනීමට කටයුතු කරමි. | සියලු හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතන 05 කට අදාළව හිඟ දැන්වීම් පුවරු ආදායම රු.170,000 ක් අයකර ගතයුතුව තිබුණි. | පිළිගනිමි. | හිඟ දැන්වීම් පුවරු ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළයුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ රු.3,488,150 ක යන්ත්‍ර කුලී හිඟ ශේෂයක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | හිඟහිටි යන්ත්‍ර කුලී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | වසර 10 කටත් වඩා පැරණි රු.773,887 ක විනෝද බදු අයකර ගැනීමට අදාළව කිසිදු පියවරක් ගෙන තිබුණි. | පිළිගනිමි. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | සේවය අත්හැර යාම හේතුවෙන් පුද්ගලයන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.334,410 ක ආපදා ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | කඩිනමින් එම ශේෂ අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුවේ. |

### 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2004 හා 2005 වර්ෂවලදී රු.2,500,000 ක වියදමක් දරා ඇඹුල්ගස්වැව ප්‍රදේශයේ ඉදිකර තිබුණු කසළ කළමනාකරණ අංගනය හා ජීව ටැංකි 04 ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි. | ජීව ටැංකි භාවිතයට ගැනීම සඳහා සලකා බලමින් සිටී. | මෙම වත්කම් භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුවේ. |
| (ආ) | සභාව සතු වටිනාකම රු.8,751,000 ක්වූ ගොඩනැගිලි 06 ක් වසර කීපයක සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි. | පිළිගනිමි. | අදාළ ගොඩනැගිලි භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුවේ. |

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති අංක NCP/BP/120 හා NCP/BP/122 මගින් රු.7,934,927 ක ප්‍රතිපාදන අනුමත වූ ව්‍යාපෘති 02 ක් විධිමත්ව ප්‍රසම්පාදන කටයුතු සිදුනොවීම නිසා 2021 දෙසැම්බර් 31 දිනට ක්‍රියාත්මක නොකර අතහැර දමා තිබුණි. | පිළිගනිමි. | ව්‍යාපෘතිවලට අදාළව ප්‍රසම්පාදන කටයුතු විධිමත්ව සිදුකර ප්‍රතිපාදන උපරිම මට්ටමින් ප්‍රයෝජනයට ගතයුතු වේ. |
| (ආ) | 2021 වර්ෂයේ ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට ඇස්තමේන්තු කළ ගිවිසුම්ගත වටිනාකම රු.135,000,000 ක් වූ කුට්ටිගල් ඇල්ලීමේ ව්‍යාපෘති 98 කින් 04 ක් පමණක් ආරම්භ කර තිබුණු නමුත් ඉතිරි ව්‍යාපෘති අවිච්ඡේද කරන්නේද අවලංගු කරන්නේද යන්න තහවුරු කරගෙන නොතිබුණි. | මෙම ව්‍යාපෘති අවිච්ඡේද කිරීමක් හෝ අවලංගු කළ බවට ප්‍රතිපාදන ලබාදුන් අමාත්‍යාංශය විසින් දැනුම්දීමක් සිදුකර නැත. | ඉතිරි ව්‍යාපෘති අවිච්ඡේද කරන්නේද අවලංගු කරන්නේද යන්න පිළිබඳව තහවුරුවක් ලබාගැනීමට ක්‍රියාකළ යුතුවේ. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

**පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වාර්ෂික අයවැය මගින් රු.50,000 ක් වෙන්කර ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණු නමුත් අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා රු.995 ක් පමණක් වියදම් කර තිබුණි. එසේම සභා බලප්‍රදේශයේ ජනනය වන දිරන සහ නොදිරන කසළ ඇඹුල්ගස්වැව ප්‍රදේශයේ විවෘත ස්ථානයකට වර්ගකිරීමකින් තොරව බැහැර කරන අතර එම ස්ථානයට වන අලි ඇතුළු සතුන් නිරන්තරයෙන්ම පැමිණීම නිසා ඔවුන්ගේ ජීවිතවලට මෙන්ම පරිසරයටද හානි සිදුවෙමින් පැවතුණි. | පිළිගනිමි. කසළ අංගනය විධිමත් ලෙස ඉදිකිරීම අවසන් වූ පසු කසළ ප්‍රතිචක්‍රීයකරණයට අවශ්‍ය කටයුතු සිදුකරමි. | විධිමත්ව කසළ කළමනාකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කළ යුතුවේ. |